ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර II විභාගය - 2026 ජනවාරි

## (204) ව්‍යාපාර කළමනාකරණය

**(**Business Management**)**

---

මෙම ප්‍රශ්න පත්‍රය අනිවාර්ය ප්‍රශ්න 07 කින් **A, B** සහ **C** ලෙස කොටස් තුනකින් සමන්විත විය.

## A - කොටස

### ප්‍රශ්න අංක **01**

මෙම ප්‍රශ්නය වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQ) පහළොවකින් (15) සමන්විත වේ. පළවෙනි ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු සංඛ්‍යාව 25 කි. ව්‍යාපාර කළමණාකරණ විෂය නිර්දේශයෙන් බොහෝ අංශ ආවරණය වන පරිදි ප්‍රශ්න ඉදිරිපත් කරන ලදී.

**1.1** සිට **1.5** දක්වා උප ප්‍රශ්න වලදී ලකුණු 10 ක් ලබා ගැනීම සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරාගෙන තෝරා ගත් පිළිතුරු අංක පිළිතුරු පොතේ ලිවිය යුතුය. මුළු ලකුණු ලබා ගැනීම සඳහා අයදුම්කරුවන්ගෙන් බහුතරයක් නිවැරදි පිළිතුර තෝරාගෙන තිබුණි. විෂය පිළිබඳව අවම දැනුම නිසා සමහර අයදුම්කරුවන් නිවැරදි පිළිතුර තෝරා ගැනීමේදී පටලවාගෙන තිබුණි. ඇතැම් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු අංකය සඳහන් කරනවා වෙනුවට සම්පූර්ණ පිළිතුර වචනවලින් ලියා ඇති බවද නිරීක්ෂණය විය.

උප ප්‍රශ්න **1.6** සිට **1.10** දක්වා ලකුණු 05 ක් ලබා ගැනීම සඳහා අයදුම්කරුවන් වරහන් තුළ ලබා දී ඇති උත්තර දෙකකින් නිවැරදි උත්තරය තෝරා ප්‍රශ්න අංකය සමග පිළිතුරු පොතේ ලිවිය යුතු විය. මෙම කොටස සඳහා ද අයදුම්කරුවන්ගෙන් බහුතරයක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. සමහර අයදුම්කරුවන් වචනවලින් නිවැරදි පිළිතුර ලබා දෙනවා වෙනුවට 1 හෝ 2 ලියා ඇත.

අංක **1.11** සිට **1.15** දක්වා ඇති උප ප්‍රශ්න සඳහා ලකුණු 10 ක් ලබා ගැනීම සඳහා කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය සමග පිළිතුරු පොතේ ලිවීම අපේක්ෂා කරන ලදී. බහුතරයක් වූ පිළිතුරු කෙටි පිළිතුරු නොවූ අතර මෙම ප්‍රශ්න 05 සඳහා බොහෝ විකල්ප පිළිතුරු සපයා තිබුණු අතර ලකුණු ඒ අනුව වෙන් කරන ලදී. සීමිත අයදුම්කරුවන් ප්‍රමාණයක් ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා පිළිතුරු සපයා නොතිබූ අතර එය මාධ්‍යන් තුනෙහිම දක්නට ලැබිණ.

**1.11** සාර්ථක සන්නාමයක් සඳහා අවශ්‍යතාවයන් දෙකක් සඳහන් කරන ලෙස ප්‍රශ්නයෙන් ඉදිරිපත් කර තිබුණි. බහුතරයක් වූ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සැපයීමට උත්සාහ කර තිබූ අතර ඇතැම් අයදුම්කරුවන් අදාලත්වය, පැහැදිලි බව, අනුකූලතාව සහ සංගතතාව වැනි නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත. සමහර අයදුම්කරුවන් සාර්ථක සන්නාමයක් සඳහා අවශ්‍යතාවයන් සඳහන් කරනවා වෙනුවට සාර්ථක සන්නාමයක වාසි දක්වා තිබිණ.

**1.12** නිලතන්ත්‍රවාදී කළමණාකරණ න්‍යායේ ලක්‍ෂණ දෙකක් සඳහන් කිරීමේදී බොහෝ අයදුම්කරුවන් විශේෂීකරණ, ධූරාවලිය, කොන්දේසි, අපක්‍ෂපාතීත්වය සහ රාජ්‍ය පෞද්ලික අංශය වැනි නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත. කෙසේ වෙතත් පිළිගත හැකි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන ලදී.

**1.14** "අලෙවි කළමණාකරණය" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් ඉදිරිපත් කර ඇත. සාමාන්‍ය අයදුම්කරුවන් ප්‍රමාණයක් නිවැරදි පිළිතුරු සපයා තිබූ අතර, ඇතැම් පිළිතුරු ඉතා දීර්ඝ වූ අතර ඉතාමත් කෙටි පිලිතුරු ද දක්නට ලැබිණි. නිවැරදි නිර්වචනයන් සීමිත වූ අතර බහුතර අයදුම්කරුවන් නිවැරදි නොවූ නිර්වචනයන් ඉදිරිපත්කොට තිබුණි.

**1.15** "මානව සම්පත් කළමණාකරණයේ ද්විත්ව වගකීම" යන්න කෙටියෙන් පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් ඉදිරිපත් කර තිබුණි. බහුතරයක් වූ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා නොතිබුණු අතර සමහර අයදුම්කරුවන් පැහැදිලි කිරීමක් කර නොතිබීම හෝ වැරදි පැහැදිලි කිරීම කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## <u>B - කොටස</u>

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න 05 කින් සමන්විත වූ අතර, එක් එක් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ලකුණු 50 ක් ලබා දී තිබුණි. මෙම ප්‍රශ්න 5 සඳහා අයදුම්කරුවන්ගෙන් බහුතරයකගේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි. සමහර අයදුම්කරුවන් පමණක් ප්‍රශ්න සඳහා පිළිතුරු ලියා නොමැති බවත්, සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන් කිහිප දෙනෙකු අසතුටුදායක පිළිතුරු ලබා දී ඇති බවත් නිරීක්ෂණය විය.

## ප්‍රශ්න අංක **02**

මෙම ප්‍රශ්නය **(a), (b)** සහ **(c)** කොටස් තුනකින් සමන්විත විය.

**(a)** තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවරයන් සඳහන් කිරීම ප්‍රශ්නයෙන් අවශ්‍ය කර තිබුණි. ඉතාමත් සීමිත අයදුම්කරුවන් පිරිසක් ප්‍රශ්නයට අදාල නොවන පැහැදිලි කිරීම් සපයා තිබිණි. ඇතැම් අවස්ථාවලදී "ගැටළුව" යන යෙදීම වෙනුවට "තීරණය" යන වචනය වැරදියට භාවිතා කොට තිබුණි. මෙය විෂය නිර්දේශයෙන් සෘජුවම අසා තිබූ ප්‍රශ්නයක් වූ අතර පිලිතුරු සපයා තිබූ අයදුම්කරුවන් බහුතරයක් වෙන්කර තිබුණු ලකුණු හිමිකරගෙන ඇත.

**(b)** **සීමාසහිත tech solution (පෞද්ගලික) සමාගමේ** තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී, සැලසුම්කරණය උපකාරීවන ආකාරය පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් ඉදිරිපත් කොට ඇත. මෙය සෘජු මෙන්ම පහසු ප්‍රශ්නයක් වුවද සමහර අයදුම්කරුවන් දුර්වල මට්ටමේ පිලිතුරු ඉදිරිපත් කොට තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් සැලසුම්කරණය තීරණ ගැනීමට උපකාරීවන ආකාරය හඳුනාගෙන නොතිබූ අතර ඉන් පෙන්නුම් කරන්නේ අයදුම්කරුවන් තුළ කළමනාකරණ සංකල්ප පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති බවයි.

**(c)** සැලසුම්කරණයේ මූලධර්ම හතරක් සඳහන් කිරීම ප්‍රශ්නයෙන් අවශ්‍යකර තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයීමට අසමත් වී ඇත. සාමාන්‍ය අයදුම්කරුවන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය මග හැරීම හෝ කරුණක් හෝ දෙකක් පමණක් ඉදිරිපත් කොට තිබිණි. ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නය පිළිබඳ අවබෝධයක් නොමැතිව වැරදි පිළිතුරු සපයා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය **(a)** හා **(b)** ලෙස කොටස් දෙකකින් සමන්විත විය.

**(a)** **සීමාසහිත Brightech සමාගමට** අභිප්‍රේරණය වැදගත්වීමට හේතු 3ක් පැහැදිලි කරන ලෙසට ප්‍රශ්නයෙන් ඉදිරිපත් කොට තිබුණි. බහුතරයක් වූ අයදුම්කරුවන්ට අභිප්‍රේරණය පිළිබඳ මූලික අවබෝධයක් ඇති බවක් පෙන්නුම් කරනු ලැබුවද අනෙක් අයට පැහැදිලි අවබෝධයේ මද බවක් පෙනුන අතර පිළිතුරු **සීමාසහිත brightech සමාගමට** අදාලව ඉදිරිපත් කිරීමට ඔවුන් අපොහොසත් වී ඇත.

ඵලදායීතාවය වැඩි කිරීම, සංවිධානාත්මක කාර්යක්‍ෂමතාව සහතික කිරීම, පක්‍ෂපාතී සහ ක්‍රියාශීලී ශ්‍රම බලකායක් සහතික කිරීම සහ මෙහෙය වීම සඳහා පහසුකම් සැපයීම වැනි ඉතා නිවැරදි පිළිතුරු අපේක්‍ෂා කරන ලදී. ඉතාමත් සීමිත අයදුම්කරුවන් පිරිසක් ප්‍රශ්නය නියමලෙස අවබෝධ කර නොගෙන, නිෂ්පාදිතය සඳහා පාරිභෝගිකයනගේ අභිප්‍රේරණය පැහැදිලි කොට තිබිණි.

**(b)** **සීමාසහිත Brightech සමාගමට** තම තරඟකාරී ස්ථානය නැවත ලබා ගැනීම සඳහා ඩිජිටල් අලෙවිකරණය භාවිතා කළ හැකි ආකාර දෙකක් පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් ඉදිරිපත් කර ඇත. බහුතරයක් අයදුම්කරුවන්ගේ ඩිජිටල් අලෙවිකරණ උපායමාර්ග පිළිබඳ අවධානය යොමුකර තිබුණි. දැනුම ඉතාමත් අවම මට්ටමක පවතින බවක් පෙන්නුම් කරයි. ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සපයා වෙන්කරන ලද ලකුණු ලබාගෙන ඇත්තේ ඉතාමත් සීමිත අයදුම්කරුවන් සංඛ්‍යාවකි. ඇතැම් පිළිතුරු තරගකාරී ස්ථානය නැවත ලබා ගැනීමට භාවිතා කළ හැකි අයුරු දැක්වීම වෙනුවට ඩිජිටල් අලෙවිකරණයේ වාසි පිළිබඳ අවධානය යොමු කර තිබුණි. ඇතැම් අයදුම්කරුවන් තම පිළිතුරු සමාජ මාධ්‍ය අලෙවිකරණයට පමණක් සීමා කර ඇත. තවත් අයදුම්කරුවන් ප්‍රශ්නය නිසි පරිදි අවබෝධ කරගෙන නොතිබූ අතර ඔවුන් කරුණු දක්වා තිබුණද, ඒවා විස්තර කොට නැත. ඇතැම් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයීමට උත්සාහා දරා නොමැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක **04**

මෙම ප්‍රශ්නය **(a), (b)** සහ **(C)** ලෙස කොටස් 3 කින් සමන්විත වූ අතර වෙන්කර ඇති ලකුණු සංඛ්‍යාව 10 කි.

**(a)** හොඳ සංවිධානමය ව්‍යුහයකින් **සීමාසහිත Silverline සමාගමට** ලැබෙන ප්‍රතිලාභ 4 ක් සඳහන් කරන අයදුම්කරුවන්ගෙන් විමසා තිබුණි. බහුතරයක් වූ අයදුම්කරුවන් අපේක්ෂිත පිළිතුරු ඉදිරිපත් කොට වෙන්කරන ලද ලකුණු ප්‍රමාණය ලබා ගෙන ඇත. කෙසේවෙතත් ඇතැම් අයදුම්කරුවන් එකම පිළිතුර කිහිප වතාවක් ඉදිරිපත් කර ඇති අතර ඔවුන් කළමණාකරණ සංකල්ප සහ සංවිධාන ව්‍යුහය වරදවා වටහාගෙන තිබුණි තවත් සීමිත අයදුම්කරුවන් පිරිසක් ප්‍රශ්නය නිවැරදි ලෙස නොකියවා විකල්ප පිළිතුරු සපයා තිබුණි.

**(b)** **සීමාසහිත Silverline සමාගමේ** සාර්ථකත්වය සඳහා මෙහෙයුම් කළමණාකරණය වැදගත් වීමට හේතු දෙකක් පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් ඉදිරිපත් කොට තිබුණි. බහුතරයක් වූ අයදුම්කරුවන් පිළිගත හැකි පිළිතුරු ඉදිරිපත් කොට ඇත. කළමණාකරණය සහ මෙහෙයුම් කළමණාකරණය අතර ඇති වෙනස පැහැදිලිව වටහා ගැනීමට හැකියාව අයදුම්කරුවන්ට ඇති හැකියාව අඩු බවක් නිරීක්ෂණය විය. ඇතැම් පිළිතුරුවල හේතුවක් සඳහන් කර තිබුණද එය විස්තර කොට නැත. තවත් අයදුම්කරුවන් පිරිසක් සිද්ධියට අදාල නොවන තොරතුරු ඉදිරිපත් කර තිබූ අතර ඔවුන් නියමිත ලකුණ ලබා ගැනීමට අපොහොසත් විය.

**(c)** සමස්ථයක් ලෙස අයදුම්කරුවන් විසින් කළමණාකරණයේ ප්‍රතිලාභ ආශ්‍රිත පිළිතුරු ඉදිරිපත් කොට තිබුණි. කෙසේ වෙතත් එකම කරුණ විවිධාකාරයෙන් ඉදිරිපත් කොට ඇති බවක් නිරීක්ෂණය විය. බොහෝමයක් පිළිතුරු පැහැදිලි සහ නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කොට නැත. අයදුම්කරුවන් තුළ සංවිධානාත්මකව නිවැරදි පැහැදිලි කිරීම සහිතව පරිපූර්ණ පිළිතුරු සැපයීමට බලවත් පරිශ්‍රමයක් ගත්තද කළමණාකරණ සංකල්ප පිළිබඳගැඹුරු අවබෝධයක් නොමැති බවක් නිරීක්ෂණය විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක **05**

මෙම ප්‍රශ්නය **(a), (b)** සහ **(c)** ලෙස කොටස් 3 කින් සමන්විත වූ අතර වෙන්කර ඇති ලකුණු සංඛ්‍යාව 10 කි.

**(a)** "රැකියා විස්තරයක්" සහ "රැකියා පිරිවිතරයක්" අතර වෙනස පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් ඉදිරිපත්කොට ඇත. සාමාන්‍යයට වඩා අඩු අයදුම්කරුවන් පිරිසක් නිවැරදි පිළිතුර සපයා තිබූ අතර බොහෝමයක් අයදුම්කරුවන්ට රැකියා පිරිවිතරයක් පිළිබඳ අවබෝධයක් නොමැති බවක් හෝ තිබෙන අවබෝධය ඉතා අල්ප බව නිරීක්ෂණය විය.

**(b)** **නෝවා ටෙක්ස්ටයිල්** ආයතනයට සඵලදායී කාර්යසාධන ඇගයීම් පද්ධතියක් වැදගත් වන්නේ ඇයි දැයි යන්නට හේතු දෙකක් පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් ඉදිරිපත් කර ඇත. බොහෝමයක් අයදුම්කරුවන් මෙම කොටසට පිළිතුරු ලබා දීමට උත්සාහ දරා ඇති නමුත් ඉදිරිපත් කර ඇති පිළිතුරු ප්‍රශ්නයට අදාල වනසේ පැහැදිලිව පෙළගස්වා නොමැත. බොහෝ අයදුම්කරුවන් පිළිතුරු සැපයීමේදී පිළිතුරු දී ඇති සිද්ධියට සම්බන්ධ වන පරිදි ඉදිරිපත් කිරීමට අසමත් වීම සහ කරුණු පිළිබඳ පැහැදිලි කිරීම් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

**(c)** **නෝවා ටෙක්ස්ටයිල්හි** සේවකයන් වෙනස් වීමට ප්‍රතිරෝධය දැක්වීමට හේතු තුනක් සඳහන් කිරීම ප්‍රශ්නයෙන් අවශ්‍ය කර ඇත. බහුතරයක් වූ අයදුම්කරුවන් අවිනිශ්චිතතාවය, ස්වයං අවිනිශ්චිතතාවය, ස්වයං අවශ්‍යතා වලට තර්ජනයක් වීම, විවිධ සංජානනයන් අහිමි වීමේ හැඟීම, අසාර්ථක වීමේ බිය වැනි නිවැරදි පිළිතුරු සපයා තිබිණි. කෙසේවෙතත් ඇතැම් අයදුම්කරුවන් අනෙකුත් ප්‍රතිරෝධයට ඇතිවීමට හේතු පිළිබඳ අවධානයන් යොමු නොකොට තොරතුරු තාක්‍ෂණ පද්ධතියේ වෙනස් වීම් පමණක් පිළිතුරු ලෙස දක්වා ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක **06**

මෙම ප්‍රශ්නය සකසා ඇත්තේ **සීමාසහිත Zenith සමාගම** විසින් පාලනයේදී සලකා බැලිය යුතු සාධක, විස්තීරණ උපාය මාර්ග සහ නායකත්වය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්‍ෂා කිරීමටයි.

**(a)** සංවිධානයක් විසින් භාවිතා කරනු ලබන විස්තීරණ උපාය මාර්ග දෙකක් පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් ඉදිරිපත් කර තිබුණි. සමස්ථයක් ලෙස ගත් කළ කාර්යාසාධනය දුර්වලය. ඇතැම් අයදුම්කරුවන්ගේ පිළිතුරු දී ඇති සිද්ධියට අදාල නොවන සේ ඉදිරිපත් කිරීම තුළින් ගම්‍ය වන්නේ ඔවුන් අදාල ප්‍රශ්නය නිසි ලෙස අවබෝධකරගෙන නොමැති බවකි. ඉතාමත් සීමිත අයදුම්කරුවන් ප්‍රමාණයක් වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලබා ගෙන ඇත. මීට අමතරව බහුතරයක් අයදුම්කරුවන්ගේ විෂය කරුණු පිළිබඳ ඇති දැනුම අල්ප වීම හේතුවෙන් විස්තීරණ උපාය මාර්ග නිවැරදිව හඳුනා ගැනීමට අපොහොසත් වී ඇත. එබැවින් සපයන ලද පිළිතුරු පරිපූර්ණ නොවීය.

**(b)** "පරිවර්ථනීය නායකත්වය" සහ "ගනුදෙනු නායකත්වය" අතර වෙනස පැහැදිලි කිරීම ප්‍රශ්නයෙන් අවශ්‍යකොට තිබුණි. ගනුදෙනු නායකත්වය සමග සැසඳීමේදී බහුතරයක් අයදුම්කරුවන් තුළ ගනුදෙනු නායකත්වයට සාපේක්‍ෂව පරිවර්ථනීය නායකත්වය පිළිබඳ දැනුමක් නොමැති වීම හෝ තිබෙන දැනුම ඉතාමත් සීමිත බව නිරීක්‍ෂණය විය. සපයන ලද පැහැදිලි කිරීම් බොහොමයක් විට ඉතා අපැහැදිලි හෝ නිවැරදි නොවීය. සාර්ථක පිළිතුරු ලබානොදුන්නේ මන්දයත් බොහොමයක් අයදුම්කරුවන්ට නායකත්වය පිළිබඳ යම් දැනුමක් තිබුණද දක්වා තිබූ නායකත්ව ශෛලීන් දෙක අතර ඇති වෙනස්කම් හඳුනා ගැනීමට හෝ පැහැදිලි කිරීමට අසමත් වූ බැවිනි.

**(c)** **සීමාසහිත Zenith සමාගම** විසින් පාලනයේදී සලකා බැලිය යුතු සාධක තුනක් සඳහන් කිරීම ප්‍රශ්නයෙන් අවශ්‍යකර තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් දී ඇති සිද්ධිය පිළිබඳ අවධානය යොමු නොකොට ඉතාමත් දුර්වල පිළිතුරු සපයා ඇත. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයෙන් විමසා සිටියේ කුමක්ද යන්න පිළිබඳ නිවැරදිව හඳුනා නොගත් ස්වරූපයක් දක්නට ලැබිණ. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට පිරිනමා ඇති ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට තරම් ප්‍රමාණවත් පිළිතුරු සැපයීමට නොහැකි වී ඇත.

ලකුණු හිමිකරගත් අයදුම්කරුවන් පහත දක්වා ඇති පරිදි නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර ඇත:

- සැලසුම්ගත අරමුණු
- සංකීර්ණත්වය දරා ගැනීමේ හැකියාව
- සංවිධානයේ ප්‍රමාණය සහ ව්‍යුහය සමග ගැලපීම
- අභිප්‍රේරණ මට්ටම
- කළමණාකරණයේ අපේක්ෂාවන්
- පිරිවැය ඵලදායීතාවය

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## C කොටස

### ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය පදනම් වූයේ **සීමාසහිත Moon Hotels පොදු සමාගම** ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ විවිධ පැතිකඩයන් පරීක්ෂා කිරීමයි. ප්‍රශ්නය **(a), (b), (c), (d)** සහ **(e)** ලෙස උපකොටස් 5 කින් සමන්විත වූ අතර වෙන්කරල ලද ලකුණු ප්‍රමාණය 25 කි.

**(a)** නූතන යුගයේ නායකයෙකුට අවශ්‍ය විශිෂ්ඨ නායකත්ව සාධක තුනක් සඳහන් කිරීම ප්‍රශ්නයෙන් අවශ්‍ය කර තිබුණි. බහුතරයක් වූ අයදුම්කරුවන් මේ සඳහා නිවැරදි පිළිතුර ඉදිරිපත් කර ඇත. කෙසේවෙතත් ඉතාමත් සීමිත අයදුම්කරුවන් පිරිසක් නූතන යුගය පිළිබඳ අවධානය යොමු නොකොට පොදු පැතිකඩයන් සලකා පිළිතුරු සපයා තිබුණි. ඇතැම් අයදුම්කරුවන් විශිෂ්ඨ නායකත්ව සාධක සඳහන් කිරීම වෙනුවට නායකත්ව කාර්යයන්, නායකත්ව ගුණාංග සහ කුසලතා සඳහන් කොට තිබුණි.

**(b)** **සීමාසහිත Moon Hotels පොදු සමාගමේ** නායකයෙකු විසින් ඉටුකළ යුතු වැදගත් කාර්යයන් / භූමිකා තුනක් පැහැදිලි කිරීම ප්‍රශ්නයෙන් අවශ්‍යකර තිබුණි. බහුතරයක් වූ අයදුම්කරුවන් ඉතාමත් දුර්වල නිවැරදි නොවූ පිළිතුරු ඉදිරිපත් කොට තිබුණි. මෙය ඍජු ප්‍රශ්නයක් වූ අතර අයදුම්කරුවන් ඉතා පහසුවෙන් ලකුණු ලබා ගනු ඇතැයි අපේක්ෂා කෙරිණි. ඇතැම් අයදුම්කරුවන් නායකයෙකු විසින් ඉටුකළ යුතු වැදගත් කාර්යයන් පැහැදිලි කරනවා වෙනුවට henry mintzberg විසින් ඉදිරිපත්කොට ඇති කළමණාකරණ භූමිකා සඳහන් කොට තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස අයදුම්කරුවන් ලකුණු අඩුවෙන් ලබා ගත් අතර පිළිතුරු දුර්වල මට්ටමක පැවතිණි.

**(c)** **සීමාසහිත Moon Hotels පොදු සමාගමට** සඵලදායී අලෙවිකරණය වැදගත් වන්නේ ඇයි දැයි යන්නට හේතු තුනක් පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් විමසා තිබුණි. සමස්ථයක් ලෙස කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවති අතර බහුතරයක් වූ අයදුම්කරුවන් වෙන්කරල ලද සම්පූර්ණ ලකුණු හයම ලබා ගෙන තිබුණි.

**(d)** **සීමාසහිත Moon Hotels පොදු සමාගම** සම්බන්ධයෙන්, වැරදි සේවකයෙකු තෝරා ගැනීමේ තීරණයක ප්‍රතිවිපාක 04 ක් සඳහන් කරන ලෙස ප්‍රශ්නයෙන් ඉදිරිපත් කොට තිබුණි. සමස්තයක් ලෙස කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවති අතර බහුතරයක් වූ අයදුම්කරුවන් සුදුසු පිළිතුරු සපයා ඇත.

**(e)** **සීමාසහිත Moon Hotels** පොදු සමාගමට එහි අරමුණු ඉටු කර ගැනීම සඳහා උපායමාර්ගික සැලැස්මක් උපකාරවන ආකාර තුනක් පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍යකර තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයෙන් අවධාරණය කර ඇති ප්‍රධාන කරුණු පිළිබඳ අනවබෝධය හේතුවෙන් මෙම කොටසේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි. ඉතාමත් සීමිත අයදුම්කරුවන් පිරිසක් නිශ්චිත පිළිතුරු ඉදිරිපත් කොට වෙන් කරන ලද මුළු ලකුණු ප්‍රමාණය ලබා ගත්හ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමින් විය.**

- - -

**අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:**

(1) විෂය නිර්දේශය / පාඩම් මාලාව මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) උත්තර සැපයීම එක් භාෂාවකින් පමණක් විය යුතුය. එය විභාගය සඳහා අයදුම් කළ භාෂාව විය යුතුය. සෑම අලුත් ප්‍රශ්නයක් සඳහාම උත්තර සැපයීම ආරම්භ කළයුත්තේ උත්තර පොතේ අලුත් පිටුවකය.

(5) විභාගයේදි කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(6) උත්තර පත්‍ර බාරදීමට පෙර ඔබේ විභාග අංකය සහ ප්‍රශ්න අංක නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(7) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහිදී දී ඇති අර්ථකථනවලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(8) අත් අකුරු කියවිය හැකි මට්ටමක තිබීම හා උත්තරවලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සැළකිලිමත් විය යුතුය.

(9) ඒඒටි ආයතනය මඟින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

(10) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍ර සහ නියාමන ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(11) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

- * * * -